සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் /
Department of Examinations, Sri Lanka

| ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| එකතුව | |
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| ලකුණු පරීක්ෂා කළේ | |

# කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරි - II තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016 (2017)

## (01) රචනය හා සාරාංශය

පැ තුනයි

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.

විභාග අංකය : ..........................

**1.** පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන **300** ක් පමණ වන සේ විශ්ලේෂණාත්මක රචනයක් ලියන්න.

(i) වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් සුරැකීමේ දී කම්කරු දෙපාර්තමේන්තුවේ වගකීම හා කාර්යභාරය

(ii) ශ්‍රී ලංකාවේ ජනගහනය වියපත් වීම නිසා මතු විය හැකි ආර්ථික හා සාමාජික ගැටලු නිරාකරණය කිරීම

(iii) රාජ්‍ය ව්‍යවසායයන්හි පැවැත්ම සඳහා පෞද්ගලික අංශයේ සහභාගිත්වය ලබා ගැනීමේ යෝග්‍යතාව

(iv) වාණිජ බැංකු හා පෞද්ගලික මූල්‍ය ආයතන මගින් මහජනතාවට සැලසෙන සේවය හා එහි විශ්වසනීයත්වය

(v) ජාත්‍යන්තර ත්‍රස්තවාදය තුරන් කිරීම සඳහා ඇමෙරිකාව ඇතුළු බටහිර බලවතුන්ගේ මැදිහත් වීම

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

[ 2 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

(ලකුණු 36 යි)

[ 3 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

2. පහත දැක්වෙන පාඨය කියවා එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා, යෝග්‍ය මාතෘකාවක් ද දෙන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශයෙහි අග සටහන් කරන්න.

තිරසාර ඉහළ ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීම සහ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා ආර්ථික හා සමාජ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ වැදගත්කම ප්‍රතිපත්ති සම්පාදකයන් විසින් හොඳින් හැඳිනගෙන ඇති අතර, එබැවින් එය තවදුරටත් සමස්ත සංවර්ධන ක්‍රියාදාමයේ මූලික කොටසක් ලෙස පවතී. අඛණ්ඩව ආයෝජනය කිරීමේ ප්‍රතිලාභ ලබමින් බලශක්තිය, ප්‍රවාහන, මාර්ග, අධිවේගී මාර්ග, වරාය, ජල සම්පාදනය, විදුලි සංදේශ යනාදී රටේ ආර්ථික යටිතල පහසුකම් පසුගිය කාලය පුරා ක්‍රමිකව වැඩිදියුණු වූ බව දැකිය හැකිය. කෙසේ වෙතත්, මෙම පහසුකම් සඳහා වන ඉල්ලුම ඉහළ යමින් පවතින අතර, තවදුරටත් ආයෝජන අවශ්‍ය බව එමගින් පෙන්නුම් කෙරේ. ඒ සමගම, විශේෂයෙන් අධ්‍යාපනය හා සෞඛ්‍යය යන සමාජ යටිතල පහසුකම් සැපයීම සඳහා පැවති රජයන් විසින් දරන ලද ප්‍රයත්නයන් හේතුවෙන් රටේ මානව සංවර්ධනය සැලකිය යුතු දියුණුවක් ළඟා කර ගෙන ඇත.

කෙසේ වුව ද, රාජ්‍ය මූල්‍ය අවකාශය තුළ පවත්නා සීමාවන් හේතුවෙන් රටේ යටිතල පහසුකම්වල පවතින අඩුපාඩු පිරවීමට කළ යුතු යටිතල පහසුකම්වල ගුණාත්මකභාවය පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය රාජ්‍ය ආයෝජන සීමා කිරීමට සිදු වේ. රාජ්‍ය ආයෝජන ඉහළ නැංවීම සඳහා නීත්‍යනුකූල හා දීර්ඝකාලීන අවශ්‍යතාවක් පැවතිය ද රජයේ අයවැයෙහි අපේක්ෂිත ආදායම් කාර්යසාධනය පහළ මට්ටමක පැවතීම සහ පුනරාවර්තන වියදම් සාපේක්ෂව ඉහළ අගයක පැවතීම රජයේ ආයෝජන වියදම් කිසියම් මට්ටමකින් ඔබ්බට ඉහළ නැංවීමට බාධා ලෙස ක්‍රියා කරයි. අයවැය හිඟය ඉහළ යෑම සහ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ණය ඉහළ යෑම හේතුවෙන් යටිතල පහසුකම් ව්‍යාපෘති මූල්‍යනය කිරීම සඳහා රාජ්‍ය ණය පාදක කරගත් ආකෘතියක් ක්‍රියාත්මක කිරීමට සීමාකම් පවතී. යටිතල පහසුකම්වල ආයෝජනය කිරීම සඳහා රාජ්‍ය ප්‍රාග්ධනය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ඒ සඳහා පෞද්ගලික ප්‍රාග්ධනය ආකර්ෂණය කර ගැනීමට හැකි වන කොටස් ආයෝජන ක්‍රමවේදය, යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා ආයෝජනය කිරීමේ මූල්‍යන ක්‍රමය ලෙස බොහෝ රටවල් විසින් වඩවඩාත් ක්‍රියාවට නංවමින් සිටින බව දැකිය හැකිය. මෙම සන්දර්භය තුළ, විශේෂයෙන් රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්ව පදනම මත යටිතල පහසුකම් ව්‍යාපෘති මූල්‍යනය කිරීම සඳහා විශාල ප්‍රමාණයක පෞද්ගලික ප්‍රාග්ධනය ආකර්ෂණය කර ගැනීමට ආයතනික හා වෙනත් තත්ත්වයන් නිර්මාණය කිරීම අවශ්‍ය වේ.

රට තුළ රජයට අයත් ව්‍යාපාර ආයතන විසින් සිදු කරන ලද උපායමාර්ගික වශයෙන් වැදගත් මෙහෙවර නිසි ලෙස සලකා බැලිය යුතු අතර, සපයනු ලබන ආර්ථික යටිතල පහසුකම් දිරිගැන්වීමේ දැඩි අවශ්‍යතාවක් පවතී. විශේෂයෙන්ම, විදුලිබලය හා බලශක්ති අංශය මෙන්ම සිවිල් ගුවන් සේවා අංශයේ රජයට අයත් ව්‍යාපාර ආයතනවල කළමනාකරණ ආකෘතියේ කාර්යක්ෂමතාව, ඵලදායිතාව, විශ්වසනීයත්වය සහ ශක්‍යතාව තුළ පවත්නා දුර්වල කාර්යසාධනය පිළිබඳව දිගින්දිගටම අවධාරණය කර ඇත. සාමාන්‍ය ජනතාව මත පැනවෙන පීඩනය අඩු කරමින් වඩා දියුණු සේවා සැපයුමක් තහවුරු කිරීම සඳහා මෙම ආයතනවල පවත්නා ව්‍යාපාර පාලනය මෙන්ම මිල ක්‍රමය හා මූල්‍ය ආකෘතීන් ඇතුළු කළමනාකරණ ව්‍යුහයන් ඉතා සූපරීක්ෂාකාරී ලෙස නැවත සලකා බැලීමේ අවශ්‍යතාව මෙමගින් අවධාරණය කෙරේ.

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

[ 4 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

(ලකුණු 30 යි)

3. පහත දැක්වෙන එක් එක් පාඨය කියවා එහි අදහස හැකිතාක් දුරට කෙටි කර තනි වාක්‍යයක් වන සේ ලියා තද කළු අකුරින් මුද්‍රිත පදවලට විවරණ සපයන්න.

(i) ගෝලීය මූල්‍ය අර්බුදය හමුවේ දියුණු වෙමින් පවතින රටවල ආයෝජන සිදු කළ බොහෝ විදේශීය ආයෝජකයන් **ඉහළ ද්‍රවශීලතා** අවශ්‍යතාව හේතුවෙන් තම අරමුදල් නැවතත් සිය රටවල් කරා ගෙන ගොස් ඇත. මෙම තත්ත්වය ශ්‍රී ලංකාවට ද බලපෑවේ ය. විදේශ විනිමය ගලා ඒම් අඩුවීම සහ ණය සම්පාදනය කර ගැනීමේ දුෂ්කරතා මධ්‍යයේ විනිමය අනුපාතය අවප්‍රමාණය වීමට පීඩනයක් එල්ල විය.



Department of Examinations Sri Lanka

(ii) ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය සඳහා මූලික වශයෙන් දායකත්වයක් දක්වන බටහිර යුරෝපය ආර්ථික පසුබෑමක් කරා ළඟා වෙමින් සිටී, ගෝලීය ආර්ථික වර්ධන ප්‍රවණතාවෙහි අවිනිශ්චිතභාවය ඉහළයෑම, විනිමය අනුපාත උච්චාවචනය, රැකියා කප්පාදු කිරීම් සහ ශ්‍රී ලංකාවේ සංචාරක ඉපැයීම් සඳහා වැඩි දායකත්වයක් සපයන රටවල පිරිහෙමින් පවතින පාරිභෝගික විශ්වාසය යනාදී කරුණු හේතුවෙන් 2009 වසරේ දී ද සංචාරක ව්‍යාපාරයේ වර්ධනයක් අපේක්ෂා කළ නොහැකි වනු ඇත.

(iii) වර්තමාන ගෝලීය මූල්‍ය තත්ත්ව සහ අවිනිශ්චිතතා හේතුවෙන් ඉදිරියේ දී ලෝක ආර්ථික වර්ධන අපේක්ෂාවන් ඉටු කර ගැනීමේ අවදානමක් පවතී. මෙහි ප්‍රධාන අවදානම නම් මූල්‍ය වෙළෙඳපොළ පවතින නොසන්සුන්කාරී සහ අවිනිශ්චිතතාවන් දුරු කිරීම සඳහා ඉක්මන් හා ඵලදායී ක්‍රියාමාර්ග නොගතහොත් පිරිහෙමින් පවත්නා මූල්‍ය වෙළෙඳපොළ තත්ත්වයන් මගින් මූර්ත අංශයේ කටයුතු තවදුරටත් අධෛර්යවත් වන අතර, එය කල්පවත්නා ආර්ථික අවපාතයක් දක්වා වර්ධනය විය හැකිය.

[ 6 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

(iv) තිරසාර ඉහළ ආර්ථික වර්ධනයක් සහ අඩු උද්ධමන තත්ත්වයක් පවත්වා ගතහැකි වන ලෙස උද්ධමන අපේක්ෂාවන් හැසිරවීම සඳහා රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාපිළිවෙත ප්‍රමුඛතා පදනමින් රජය විසින් වේගවත්ව ක්‍රියාවට නැංවීම අතිශයින්ම වැදගත් වී ඇත. රටේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියේ දැනට පවත්නා අඩුපාඩු මගහරවා ගැනීමට විශේෂ අවධානයක් යොමු කළ මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ප්‍රයත්නයක දැඩි අවශ්‍යතාවක් පවතී. රජයේ ආදායම අපේක්ෂිත මට්ටමට වඩා අඩුවීම සහ රජයේ වියදම් ඉහළයාම හේතුවෙන් රජයේ ණය ගැනීමේ අවශ්‍යතාව වැඩි වන අතර, එමගින්, නොපියූ වූ රාජ්‍ය ණය ප්‍රමාණය සහ අනාගතයේ දී ගෙවිය යුතු ණය පොලී ප්‍රමාණය ඉහළ යයි.

[ 7 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

Department of Examinations Sri Lanka

(v) ශ්‍රී ලංකාව තුළ නූතන ක්‍රමවලට අනුව කිරි නිෂ්පාදන අංශය දියුණු කිරීමෙන් ග්‍රාමීය දිළිඳු ජනතාවට එකතු කළ අගය සහිත ආදායම් උත්පාදන අවස්ථා නිර්මාණය වේ. එයින් දේශීය කෘෂිකර්මාන්තය විවිධාංගීකරණයට ලක්වන අතරම පුළුල් ලෙස පැතිරුණු කෘෂිකර්මය මුල් කරගත් ගෘහ කර්මාන්ත ඇති වනු ඇත. දියුණු කළ ආරයන්ට අයත් කිරි ගවයන් යොදා ගැනීම, පෝෂ්‍යදායී ගව ආහාර ලබා ගැනීමට ඇති හැකියාව සහ කිරි නිෂ්පාදන පහසුවෙන් අලෙවි කිරීම සඳහා ශක්තිමත් වෙළෙඳපොළක් ඇති කිරීම ආදිය එවැනි දියුණු කිරි නිෂ්පාදන අංශයක් සඳහා පූර්ව අවශ්‍යතා වේ.

..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................

*(ලකුණු 05 × 5 = 25 යි)*

**4.** පහත දැක්වෙන එක් එක් පාඨය අවසානයේ (අ), (ආ), (ඉ) යනුවෙන් ප්‍රකාශ තුනක් ඇත. මෙයින් කවර ප්‍රකාශයක් අදාළ පාඨයට වඩාත් හොඳින් ගැළපේ දැයි දක්වන්න. නිදසුනක් වශයෙන් (i) පාඨයට වඩාත්ම ගැළපෙන ප්‍රකාශය (අ) නම් ඔබේ පිළිතුර විය යුත්තේ (i) .......... (අ) යන්නය.

(i) මාර්ග ජාලයේ සංවර්ධනය, දිස්ත්‍රික් හා පළාත් අතර මෙන්ම ඒවා තුළ ඇති විෂමතාවන් අවම කිරීමට ද හේතු වේ. මාර්ග ජාලයේ සංවර්ධනය ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ අතර ඇති සම්බන්ධතාව වැඩි දියුණු කිරීමට උපකාරී වන අතර, ඒ මගින් භෞතික හා මානව සම්පත් මෙන්ම අනෙකුත් සේවාවන් කෙරෙහි ප්‍රවේශ වීම සඳහා ද ඉඩ ප්‍රස්තා සැලසෙයි. ඒ මගින් තවදුරටත්, වෙළෙඳපොළවල් මෙන්ම අධ්‍යාපනය හා සෞඛ්‍ය සේවා සඳහා ජනතාවට ප්‍රවේශ වීමේ ඉඩ ප්‍රස්තා වැඩි දියුණු කරනු ලැබේ.

(අ) මාර්ග ජාලයේ සංවර්ධනය දිස්ත්‍රික් හා පළාත් අතර සම්බන්ධතාව වැඩිකර විෂමතා අවම කිරීමටත් භෞතික හා මානව සම්පත් හා වෙළඳපොළ, අධ්‍යාපනය හා සෞඛ්‍ය සේවා සඳහා ජනතාවට ප්‍රවේශ වීමටත් ඉඩ ප්‍රස්තා සපයයි.

(ආ) දිස්ත්‍රික් හා පළාත් අතර විෂමතා අවම කර සම්බන්ධතා වැඩි කිරීමටත් වෙළෙඳපොළ, අධ්‍යාපන හා සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශ වීමටත් මානව සම්පත් දියුණු කිරීමටත් මාර්ග ජාල සංවර්ධනය ඉඩ ප්‍රස්තා ඇති කරයි.

(ඉ) මාර්ග ජාල සංවර්ධනය නොකරන්නේ නම් වෙළෙඳපොළ, අධ්‍යාපන හා සෞඛ්‍ය සේවා සඳහා ජනතාවට ප්‍රවේශ වීමටත් දිස්ත්‍රික් හා පළාත් අතර විෂමතා අවම කර සම්බන්ධතා වැඩි කිරීමටත් හැකිවන්නේ නැත.

..............................................................................

[ 8 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

(ii) පාරිභෝගිකයන්ගේ ඉල්ලුම සපුරාලීම සහ දුම්රිය සේවය වෙත මගී ජනතාව ආකර්ෂණය කර ගැනීම සඳහා දුම්රිය සේවය වැඩි දියුණු කිරීමට පියවර ගණනාවක් ගෙන තිබේ. කොළඹ-මාතර දුම්රිය මාර්ගය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ පළමු පියවර යටතේ දුම්රිය මාර්ග වැඩි දියුණු කරන අතර, පානදුර, කළුතර, ගාල්ල සහ මාතර ඇතුළුව තෝරාගත් දුම්රිය නැවතුම් පොළවල් සංවර්ධනය කරනු ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා ණය ගිවිසුම ඉන්දීය රජය සමග දැනටමත් අත්සන් කර ඇත. දෙවන පියවර යටතේ කළුතර දකුණ සිට මාතර දක්වා දෙවන මාර්ගය ඉදිකරනු ඇත.

(අ) කොළඹ - මාතර දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරීම, තෝරාගත් දුම්රියපොළවල් සංවර්ධනය කිරීම, ඉන්දීය රජය සමග ණය ගිවිසුම් අත්සන් කිරීම හා කළුතර දකුණ සිට මාතර දක්වා දෙවන දුම්රිය මාර්ගය ඉදිකිරීම යන ව්‍යාපෘති මගින් හෙළිවන්නේ මගී ජනතාව දුම්රිය සේවය වෙත ආකර්ෂණය කිරීමට පියවර ගණනාවක් ගෙන ඇති බවයි.

(ආ) තෝරාගත් දුම්රිය පොළවල් සංවර්ධනය කිරීම, විවිධ දුම්රිය මාර්ග වැඩි දියුණු කිරීම, ඉන්දීය රජය සමග ණය ගිවිසුම් අත්සන් කිරීම ආදී කරුණුවලින් හෙළිවන්නේ පාරිභෝගිකයින්ගේ ඉල්ලුම සපුරාලීමට දුම්රිය සේවා බලධාරීන් ක්‍රියා කළ ආකාරයයි.

(ඉ) දුම්රිය සේවය වෙත මගී ජනතාව ආකර්ෂණය කරගැනීම හා පාරිභෝගිකයින්ගේ ඉල්ලුම සපුරාලීම සඳහා දුම්රිය මාර්ග දියුණුව, ඉදිකිරීම හා දුම්රිය නැවතුම් පොළවල් සංවර්ධනය කිරීම ආදිය මගින් දුම්රිය සේවය වැඩි දියුණු කිරීමට පියවර ගණනාවක් ගෙන ඇත.

.......................................................................

(iii) ශ්‍රී ලංකාව සාමාන්‍ය අධ්‍යාපනය ලබාදීම අතින් විශිෂ්ට ප්‍රගතියක් අත්පත් කරගෙන තිබුණ ද, වෘත්තීය සහ විශ්වවිද්‍යාල අධ්‍යාපන අංශයේ ජයග්‍රහණ ජාත්‍යන්තර තරගකාරී මට්ටම හා සැසඳීමේ දී පසුපසින් සිටී. අධ්‍යාපන පද්ධතිය හා සම්බන්ධ ප්‍රධාන ගැටලු වශයෙන් සමානාත්මතාව, ගුණාත්මකභාවය, කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව සම්බන්ධ ගැටලු හැඳිනගෙන ඇත. දස අවුරුදු දැක්ම මෙම ගැටලු හැඳිනගෙන ඇති අතර සමාජයේ අලුතින් පැන නගින අභියෝගවලට මුහුණදීම සඳහා අවශ්‍ය කුසලතා සමග ගුණාත්මක බවින් යුත් ශ්‍රම බලකායක් ඇති කළ හැකි වඩාත් ගතික අධ්‍යාපන අංශයක් ඇති කිරීම සඳහා අධ්‍යාපන ක්ෂේත්‍රයේ අවශ්‍ය වෙනස්කම් සිදු කිරීමට සැලසුම් කර ඇත.

(අ) දස අවුරුදු දැක්ම යටතේ හැඳිනගත් සමානාත්මතාව, ගුණාත්මකභාවය, කාර්යක්ෂමතාව හා ඵලදායිතාව යන ගැටලුවලට හා සමාජයේ නව අභියෝගවලට මුහුණදීම සඳහා ගතික අධ්‍යාපනයක් ඇති කරමින් අධ්‍යාපන අංශයේ වෙනස්කම් ඇති කිරීමට සැලසුම් කර ඇත.

(ආ) තිරසාර ඉහළ ආර්ථික වර්ධනයක් හා සංවර්ධනයක් ළඟා කරගැනීම සඳහා නව දැනුම පිළිබඳ මං සෙවීමට හා ශ්‍රම වෙළෙඳපොළෙහි ගතික අවශ්‍යතා සමග ගැළපෙන පරිදි අධ්‍යාපන අංශය දියුණු කිරීම අවශ්‍ය වේ.

(ඉ) ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළෙඳපොළෙහි ගතික අවශ්‍යතාවලට ගැළපෙන අයුරින් අධ්‍යාපන අංශය දියුණු කිරීමට පියවර නොගන්නේ නම් තිරසාර ඉහළ ආර්ථික වර්ධනයක් හා සංවර්ධනයක් ළඟා කරගැනීමට හෝ නව දැනුම පිළිබඳ මං සොයා යාමට හෝ නොහැකි වනු ඇත.

.......................................................................

*(ලකුණු 03 × 3 = 09 යි)*

* * *

Department of Examinations Sri Lanka